සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

57439 AL/2012/33/S-II

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

33 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස් :

* **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
* අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

**1.** 2012.03.31 දිනට සීමිත පර්ල් පොදු සමාගමේ ශේෂ පිරික්සුම පහත දී ඇත.

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| ඉඩම් (පිරිවැයට) | 2 200 | |
| ලී බඩු සහ සවිකිරීම් (පිරිවැයට) | 4 000 | |
| 2011.04.01 දිනට සමුච්චිත ක්ෂය - ලී බඩු සහ සවිකිරීම් | | 400 |
| වෙළඳ ණයගැතියෝ | 400 | |
| 2011.04.01 දිනට අඩමාන ණය සඳහා වෙන්කිරීම් | | 50 |
| 2011.04.01 දිනට තොගය (පිරිවැය මත) | 500 | |
| මුදල් සහ මුදල් සමාන ද | 150 | |
| විකුණුම් | | 4 800 |
| ගැනුම් | 1 500 | |
| වියදම් | 1 000 | |
| වෙළඳ ණයහිමියෝ | | 300 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටස් 400 000) | | 3 000 |
| 2011.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 1 200 |
| | 9 750 | 9 750 |

**අතිරේක තොරතුරු:**

(අ) ශේෂ පිරික්සුමේ දී ඇති වියදම් පහත අයිතමවලින් සමන්විත වේ:

| වියදම් වර්ගය | රු. '000 |
|---|---|
| බෙදාහැරීම් | 450 |
| පරිපාලන | 500 |
| මූල්‍ය | 50 |
| එකතුව | 1 000 |

(ආ) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙහි වෙනස්වීම පහත පරිදි වේ.

| | රු. '000 |
|---|---|
| 2011.04.01 දිනට ශේෂය | 2 000 |
| වර්ෂය තුළ දී නිකුත් කළ කොටස් 100 000 හි අගය | 1 000 |
| 2012.03.31 දිනට ශේෂය | 3 000 |

(ඇ) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත ගැළපීම් කළ යුතු වේ.

(i) 2012.03.31 දින වෘත්තීය තක්සේරුකරුවකු විසින් ඉඩම් රු. 2 500 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී.

(ii) ලී බඩු සහ සවිකිරීම් පිරිවැය මත වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

(iii) වර්ෂය අවසානයේ ණයගැති ශේෂය මත වාර්ෂිකව 10% ක අඩමාන ණය වෙන් කිරීමක් සිදු කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

(iv) 2012.03.31 දිනට තොගයේ පිරිවැය රු. 450 000 ක් විය. එදිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 500 000 ක් ලෙස ඇස්තමේන්තු කරනු ලදී.

(v) සමාගම විසින් මාස හයක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. මෙම වගකීම් සහතිකය මත රු. 60 000 ක ප්‍රතිපාදනයක් සමාගම විසින් කළ යුතු යැයි විශ්වසනීය ලෙස තක්සේරු කර ඇත.

(vi) භාණ්ඩ බෙදාහැරීම සඳහා 2011.04.01 දින මූල්‍ය කල්බදු ක්‍රමය මත සමාගම විසින් මෝටර් රථයක් අත්පත් කර ගන්නා ලදී. එදිනට මෝටර් රථයේ සාධාරණ අගය රු. 2 500 000 ක් වූ අතර එය අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගයට සමාන වේ. පහත සඳහන් තොරතුරු ද දී ඇත.

| | | |
|---|---|---|
| කල්බදු කාලය | - | වසර 5 යි. |
| මෝටර් රථයේ ඵලදායි ජීව කාලය | - | වසර 5 යි. |

වාර්ෂික කල්බදු වාරිකය (වසර අවසානයේ ගෙවිය යුතු) - රු. 600 000 (මෙයින් රු. 100 000 ක් පොලිය වේ.)

2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී කල්බදු ණයහිමියන් සඳහා ගෙවූ වාරිකය වෙළඳ ණයහිමි ගිණුමට හර කර ඇත. මේ සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් කර නොමැත. මෝටර් රථ පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

(vii) 2011.10.01 දින සමාගම විසින් එහි සියලු ම ජංගම නොවන වත්කම් රක්ෂණය කළ අතර 2012.09.30 දිනෙන් අවසන්වන එක් අවුරුදු කාලපරිච්ඡේදය සඳහා රු. 120 000 ක් රක්ෂණ වාරික ලෙස ගෙවා ඇත. ගෙවූ වාරිකය පරිපාලන වියදම් තුළ ඇතුළත් කර ඇත.

(viii) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු, බදුපෙර ලාභයෙන් 1/3 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(ix) වර්ෂය සඳහා රු. 150 000 ක අවසන් ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කර ඇත.

(x) රඳවාගත් ඉපැයුම්වලින් රු. 1 000 000 ක් මාරුකර වසර අවසානයේ දී පොදු සංචිතයක් ඇති කිරීමට තීරණය කර ඇත.

**අවශ්‍යවන්නේ:**

ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත පර්ල් පොදු සමාගමේ පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව)

(1) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(2) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2012.03.31 දිනට ශේෂ පත්‍රය

*(ලකුණු 20 යි)*

**2. (අ)** ලාභඅලාභ පිළිවෙළින් 3:2 අනුපාතයට බෙදාගන්නා **පැතුම්** සහ **රොමේෂ්** උපදේශන ආයතනයක හවුල්කරුවෝ වූහ. 2011.03.31 දිනට මෙම හවුල් ව්‍යාපාරයේ ශේෂ පත්‍රය පහත පරිදි වේ.

| | රු. '000 | රු. '000 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල, පිරියත සහ උපකරණ - පිරිවැයට | 1 300 | |
| සමුච්චිත ක්ෂය | (260) | 1 040 |
| **ජංගම වත්කම්** | | |
| තොගය-ලිපිද්‍රව්‍ය | 100 | |
| ලැබිය යුතු උපදේශන ගාස්තු | 300 | |
| මුදල් | 60 | 460 |
| | | **1500** |
| **ප්‍රාග්ධන ගිණුම්** | | |
| පැතුම් | 600 | |
| රොමේෂ් | 400 | 1000 |
| **ජංගම ගිණුම්** | | |
| පැතුම් | 150 | |
| රොමේෂ් | 150 | 300 |
| **ජංගම වගකීම්** | | |
| උපචිත කාර්යාල වියදම් | | 200 |
| | | **1500** |

**අතිරේක තොරතුරු :**

(i) 2011.04.01 දින නව හවුල්කරුවකු ලෙස ව්‍යාපාරයට **සඳුන්** බඳවා ගන්නා ලද අතර ඔහු විසින් රු. 400 000 ක් මුදලින් ප්‍රාග්ධනය ලෙස දායක විය. 2011.04.01 දින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 000 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලද අතර ඒ සඳහා සියලු ගැළපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් කළ යුතු ය. පහත දක්වෙන්නේ පැතුම්, රොමේෂ් සහ සඳුන් නව හවුල් ව්‍යාපාර ගිවිසුමේ එකඟතා ය.

(අ) සෑම හවුල්කරුවකුට ම රු. 10 000 ක මාසික වේතනයක් හිමි ය.

(ආ) ලාභඅලාභ පිළිවෙළින් 2:2:1 අනුපාතයට පැතුම්, රොමේෂ් සහ සඳුන් අතර බෙදා හැරේ.

(ii) 2012.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ සිදු වූ මුදල් ගනුදෙනුවල සාරාංශය පහත පරිදි වේ.

| | රු.'000 |
|---|---|
| **ලැබීම්** | |
| උපදේශන ගාස්තු (2011.03.31 දිනට ලැබිය යුතු ප්‍රමාණය ද ඇතුළුව) .......... | 1 300 |
| හවුල්කරුවකු ලෙස බඳවා ගැනීමේ දී සඳුන්ගෙන් ලද මුදල .......... | 400 |
| **ගෙවීම්** | |
| ලිපිද්‍රව්‍ය මිල දී ගැනීම් .......... | 200 |
| කාර්යාල සේවකයන්ගේ වේතන .......... | 140 |
| කාර්යාල වියදම් .......... | 400 |
| ගැනිලි: | |
| පැතුම් .......... | 125 |
| රොමේෂ් .......... | 110 |
| සඳුන් .......... | 105 |
| ස්ථිර තැන්පතුවක 2011.10.01 දින තැන්පත් කළ මුදල .......... (12% ක වාර්ෂික පොලියට වසරක කාලයක් සඳහා) | 500 |

www.pastpaperlk.com www.artsapi.lk

(iii) දේපල, පිරියත සහ උපකරණ වාර්ෂිකව, පිරිවැය මත 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

(iv) 2012.03.31 දිනට ජංගම වත්කම් සහ ජංගම වගකීම්:

| | |
|---|---|
| (අ) තොගය - ලිපිද්‍රව්‍ය | රු. 50 000. |
| (ආ) ලැබිය යුතු උපදේශන ගාස්තු | රු. 500 000. |
| (ඇ) උපචිත කාර්යාල වියදම් | රු. 150 000. |

**අවශ්‍යවන්නේ:**

පැතුම්, රොමේෂ් සහ සඳුන් හවුල් ව්‍යාපාරයේ පහත සඳහන් ද

(1) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන විසර්ජන ද ඇතුළුව)

(2) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්

*(ලකුණු 10 යි)*

(ආ) එකලස් සහ නිමැවුම් ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ ගබඩාවක් සීමිත රොශාන් පොදු සමාගමට ඇත. සමාගම එම 'කුඩා ප්‍රමාණයේ' සහ 'විශාල ප්‍රමාණයේ' ලෙස වර්ග දෙකක බෝනික්කන් නිෂ්පාදනය කරයි. නිෂ්පාදන ක්‍රියාවලියේ දී ඒවා නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක හරහා ගමන් කරයි. පහත තොරතුරු දී ඇත.

**අයවැයගත වාර්ෂික පොදු කාර්ය පිරිවැය:**

| | රු. |
|---|---|
| කම්හල් කුලී | 120 000 |
| යන්ත්‍ර ක්ෂය | 80 000 |
| සේවක රක්ෂණ වාරික | 50 000 |
| වක්‍ර අමුද්‍රව්‍ය - එකලස් | 106 000 |
| - නිමැවුම් | 59 000 |
| - ගබඩා | 11 000 |

**අදාළ වෙනත් තොරතුරු:**

(i)

| | එකලස් | නිමැවුම් | ගබඩාව |
|---|---|---|---|
| යන්ත්‍ර පිරිවැය (රු.) | 300 000 | 500 000 | – |
| බිම් ප්‍රමාණය (වර්ග මීටර) | 10 000 | 6 000 | 4 000 |
| සේවක සංඛ්‍යාව | 60 | 30 | 10 |
| අයවැයගත යන්ත්‍ර පැය | 5 000 | 2 000 | – |
| අයවැයගත ශ්‍රම පැය | 2 000 | 8 000 | – |

(ii) එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තුවලට පිළිවෙළින් 60% ක් සහ 40% ක් ලෙස ගබඩාව සේවා සපයයි.

(iii) පහත පදනම්වලට අනුව පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කෙරෙයි:

එකලස් දෙපාර්තමේන්තුව - යන්ත්‍ර පැය
නිමැවුම් දෙපාර්තමේන්තුව - ශ්‍රම පැය

(iv) ඒකකයක් සඳහා අවශ්‍ය පැය (විශාල ප්‍රමාණයේ බෝනික්කකුට):

යන්ත්‍ර පැය: එකලස් දෙපාර්තමේන්තුව පැය 4
ශ්‍රම පැය: නිමැවුම් දෙපාර්තමේන්තුව පැය 5

(v) විශාල ප්‍රමාණයේ බෝනික්කකු නිෂ්පාදනය කිරීමට අදාළ සත්‍ය සෘජු පිරිවැය:

සෘජු අමුද්‍රව්‍ය රු. 100
සෘජු ශ්‍රමය රු. 150

(vi) විශාල ප්‍රමාණයේ බෝනික්කකුගේ විකුණුම් මිල රු. 600 කි.

**අවශ්‍යවන්නේ:**

(1) විභාජන පදනම දක්වමින් පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (ගබඩාවේ පොදු කාර්ය පිරිවැය නැවත විභාජනය ද ඇතුළුව)

(2) විශාල ප්‍රමාණයේ බෝනික්කකුගේ නිෂ්පාදන පිරිවැය

(3) විශාල ප්‍රමාණයේ බෝනික්කන් 200 ක් විකිණීමෙන් ලැබිය හැකි ලාභය හෝ අලාභය *(ලකුණු 10 යි)*

*(මුළු ලකුණු 20 යි)*

www.pastpaperlk.com www.artsapi.lk

3. (අ) 2012.03.31 දිනට ව්‍යාපාරයක මුදල් පොතේ රු. 20 000 ක හර බැංකු ශේෂයක් පෙන්නුම් කරන ලදී. මෙදිනට රු. 10 000 ක බැංකු අයිරාවක් බැංකු ප්‍රකාශනයේ ශේෂය ලෙස පෙන්වන ලදී. පසුව කරන ලද විමර්ශනවල දී පහත ද අනාවරණය විය.

(i) බැංකුවේ තැන්පත් කළ රු. 80 000 ක චෙක්පත් උපලබ්ධි වී නොමැත.

(ii) සැපයුම්කරුවන්ට නිකුත් කළ රු. 40 000 ක චෙක්පත් ගෙවීමට ඉදිරිපත් කර නොමැත.

(iii) බැංකුවට සෘජුව ප්‍රේෂණය කරන ලද රු. 25 000 ක ස්ථාවර තැන්පත් මත පොලිය මුදල් පොතේ වාර්තා වී නොමැත.

(iv) බැංකුව විසින් ස්ථාවර නියෝග මත ගෙවූ රු. 5 000 ක රක්ෂණ වාරිකය මුදල් පොතේ වාර්තා වී නොමැත.

(v) තැන්පත් කළ රු. 10 000 ක චෙක්පතක් බැංකුව විසින් අගරු කර ඇති අතර ඒ සඳහා කිසිදු සටහනක් මුදල් පොතේ සිදුකර නොමැත.

**අවශ්‍යවන්නේ:**

(1) 2012.03.31 දිනට මුදල් පොතේ සංශෝධිත ශේෂය

(2) 2012 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය *(ලකුණු 05 යි)*

(ආ) 2012.01.01 දිනට කේවල ස්වාමි ව්‍යාපාරයක් වූ දිලානි වෙළඳ ව්‍යාපාරයේ ශේෂ පත්‍රය පහත දී ඇත.

**2012.01.01 දිනට ශේෂ පත්‍රය**

| | රු.'000 |
|---|---|
| **වත්කම්** | |
| ලී බඩු සහ සවිකිරීම් (පිරිවැය රු. 180 000) | 120 |
| තොගය | 70 |
| ණයගැතියෝ | 10 |
| මුදල් | 30 |
| **එකතුව** | 230 |
| **හිමිකම** | 180 |
| **වගකීම්** | |
| ණයහිමියෝ | 50 |
| **එකතුව** | 230 |

2012 ජනවාරි මාසයේ දී පහත සඳහන් ගනුදෙනු සහ සිද්ධි සිදුවිය.

| අංකය | ජනවාරි දිනය | ගනුදෙනුව / සිද්ධිය |
|---|---|---|
| (i) | 04 | භාණ්ඩ අත්පිට මුදලට රු. 40 000 කට විකුණන ලදී. මෙම භාණ්ඩවල පිරිවැය රු. 30 000 කි. |
| (ii) | 08 | රු. 35 000 ක වටිනාකම ඇති භාණ්ඩ ණයට ගන්නා ලදී. |
| (iii) | 12 | 2012.01.08 දින මිල දී ගත් රු. 5 000 ක භාණ්ඩ නැවත සැපයුම්කරු වෙත යවන ලදී. |
| (iv) | 15 | භාණ්ඩ ණයට රු. 50 000 කට විකුණන ලදී. මෙම භාණ්ඩවල පිරිවැය රු. 40 000 කි. |
| (v) | 18 | ණයගැතියන්ගෙන් රු. 9 000 ක මුදල් ලද අතර රු. 1 000 ක් බොල්ණය ලෙස කපා හරින ලදී. |
| (vi) | 20 | රු. 12 000 ක් සේවකයන්ගේ වැටුප් ලෙස ගෙවන ලදී. |
| (vii) | 25 | 2012.01.01 දිනට ණයහිමි ශේෂය පියවීමට මුදල් ගෙවූ අතර රු. 5 000 ක මුදල් වට්ටම් ලැබුණි. |
| (viii) | 28 | පෞද්ගලික පරිහරණය සඳහා රු. 5 000 ක මුදලක් අයිතිකරු විසින් ලබා ගන්නා ලදී. |
| (ix) | 30 | 2012.01.18 දින කපාහළ බොල් ණය මුදලින් ලැබුණි. |
| (x) | 31 | ජනවාරි මාසය සඳහා ලී බඩු සහ සවිකිරීම් සඳහා රු. 3 000 ක ක්ෂය වෙන්කරන ලදී. |

**අවශ්‍යවන්නේ:**

(1) ඉහත ගනුදෙනු සහ සිද්ධිවල බලපෑම (අගයන් ද සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර, එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද අඩු වේ නම් (−) ද යන්න සඳහන් කිරීම (පහත ආකෘතිය භාවිත කරන්න).

| අංකය | වත්කම් | | | | වගකීම් | හිමිකම් |
|---|---|---|---|---|---|---|
| | ලී බඩු සහ සවිකිරීම් | තොගය | ණයගැතියෝ | මුදල් | ණයහිමියෝ | |
| (i)<br>(ii)<br>...<br>... | | | | | | |

(2) ශුද්ධ වත්කම් පදනම මත 2012 ජනවාරි මාසය සඳහා ශුද්ධ ලාභය හෝ අලාභය හෝ ගණනය කිරීම

*(ලකුණු 10 යි)*

*(මුළු ලකුණු 15 යි)*

www.pastpaperlk.com
www.artsapi.lk

4. (අ) 2011.03.31 දිනට සීමිත කමලන් පොදු සමාගමේ දේපල, පිරියත සහ උපකරණ අයිතම දෙකක් සම්බන්ධ ව පහත තොරතුරු අදාළ වේ.

| වත්කම් | පිරිවැය (රු.'000) | ධාරණ වටිනාකම (රු.'000) | අපේක්ෂිත ඵලදායී ජීවකාලය (වසර) |
|---|---|---|---|
| ගොඩනැගිලි | 2 000 | 1 000 | 20 |
| කාර්යාලීය උපකරණ | 500 | 400 | 5 |

මෙම වත්කම් පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. (ඒවායේ සුන්බුන් අගය නොසලකා හරින්න.)
2012.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී මෙම වත්කම් සම්බන්ධයෙන් පහත ගනුදෙනු සහ සිද්ධි සිදුවිය.

| දිනය | ගනුදෙනුව / සිද්ධිය |
|---|---|
| 2011.04.01 | රු. 800 000 ක් වැය කරමින් ගොඩනැගිලි නවීකරණය කරන ලදී. එම නිසා ගොඩනැගිලිවල ඉතිරි ඵලදායී ජීව කාලය වසර 15 ක් ලෙස නැවත ඇස්තමේන්තු කරන ලදී. |
| 2012.03.31 | දනට පවතින කාර්යාල උපකරණ හුවමාරු කරගනිමින් සහ අමතරව රු. 300 000 ක මුදලක් ගෙවා නව කාර්යාල උපකරණ රු. 600 000 කට මිල දී ගන්නා ලදී. නව උපකරණයේ අපේක්ෂිත ජීවකාලය වසර 5 කි. |

**අවශ්‍යවන්නේ:**

(1) ඉහත ගනුදෙනු සහ සිද්ධි සටහන් කිරීමට ජර්නල් සටහන් (මුදල් ද සහිතව)

(2) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභයට ඉහත ගනුදෙනු සහ සිද්ධිවල බලපෑම

*(ලකුණු 05 යි)*

(ආ) **අතුල, කමල් සහ එරන්ද** සමාගමක සේවකයින් තිදෙනෙකි. ඔවුන්ගේ වැටුප් සම්බන්ධ ව 2012 මාර්තු මාසය සඳහා පහත තොරතුරු දී ඇත.

(i) වැඩකරන ලද පැය ගණන:

| සේවකයා | සතියේ දින | සති අන්තය |
|---|---|---|
| අතුල | 40 | - |
| කමල් | 40 | 10 |
| එරන්ද | 40 | 20 |

(ii) පැයකට රේටයන්:

- සතියේ දින සඳහා රේටය - පැයකට රු. 200 බැගින්
- සති අන්තය සඳහා අතිකාල ගෙවීම් - සතියේ දිනක පැයක රේටය මෙන් එක හමාරකි

(iii) සේව්‍යයා සහ සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) කරන දායකය පිළිවෙළින් 15% ක් සහ 10% කි. සේවක භාරකාර අරමුදලට (ETF) සේව්‍යයාගේ දායකය 3% කි. EPF සහ ETF ගණනය සඳහා අතිකාල ගෙවීම් සැලකිල්ලට නොගනී.

(iv) අඩු කිරීම්:

- සුභසාධක අරමුදලට මාසික සේවක දායකය - රු. 200 (එක් සේවකයකුට)
- එරන්දගේ මාසික ණය වාරිකය - රු. 4 000

**අවශ්‍යවන්නේ:**

(1) 2012 මාර්තු මාසය සඳහා වැටුප් ලේඛනය

(2) 2012 මාර්තු මාසය සඳහා වැටුප් පාලන ගිණුම, ගෙවිය යුතු EPF ගිණුම සහ ගෙවිය යුතු ETF ගිණුම

(3) 2012 මාර්තු මාසය සඳහා සේවකයින්ට අදාළ මුළු වියදම

*(ලකුණු 10 යි)*

*(මුළු ලකුණු 15 යි)*

www.pastpaperlk.com www.artsapi.lk

5. (අ) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සීමිත අමිල පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු.'000 |
|---|---|
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 600 |
| රඳවාගත් ඉපැයුම් | 400 |
| 15% ණයකර | 500 |
| ජංගම වගකීම් | 300 |
| ජංගම නොවන වත්කම් | 1 250 |
| ජංගම වත්කම්: | |
| තොගය | 300 |
| (2011.04.01 දිනට තොගය රු. 500 000) | |
| ණයගැතියෝ | 400 |
| මුදල් සහ මුදල් සමාන ද | 50 |
| විකුණුම් | 3 000 |
| විකුණුම් පිරිවැය | 2 200 |
| වර්ෂය සඳහා ආදායම් බදු | 200 |
| වර්ෂයේ ලාභය | 400 |

**අවශ්‍යවන්නේ:**

(1) ක්ෂණික අනුපාතය
(2) තොග පිරිවැටුම් අනුපාතය
(3) මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය
(4) ණය - හිමිකම් අනුපාතය
(5) පොලී ආවරණ අනුපාතය

*(ලකුණු 05 යි)*

(ආ) 2012.03.31 සහ 2011.03.31 දිනට සීමිත ගංගා පොදු සමාගමේ සාරාංශගත ශේෂ පත්‍ර පහත පරිදි වේ:

| | 2012.03.31 (රු.'000) | 2011.03.31 (රු.'000) |
|---|---|---|
| ඉඩම් | 1 250 | 1 600 |
| ගොඩනැගිලි | 250 | 150 |
| ගොඩනැගිලි මත සමුච්චිත ක්ෂය | (115) | (90) |
| යන්ත්‍ර සූත්‍ර | 400 | 400 |
| යන්ත්‍ර සූත්‍ර මත සමුච්චිත ක්ෂය | (120) | (80) |
| තොගය | 125 | 150 |
| ණයගැතියෝ | 750 | 600 |
| බැංකුවේ ඇති මුදල් | 100 | 70 |
| **එකතුව** | **2 640** | **2 800** |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 800 | 800 |
| රඳවාගත් ඉපැයුම් | 480 | 300 |
| දිගුකාලීන ණය (2011.03.31 දින ලබා ගත්) | 800 | 1 000 |
| ණයහිමියෝ | 450 | 620 |
| ගෙවිය යුතු පොලී | 60 | - |
| ගෙවිය යුතු ආදායම් බදු | 50 | 80 |
| **එකතුව** | **2 640** | **2 800** |

**අතිරේක තොරතුරු:**

(i) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පෙර ලාභය රු. 200 000 කි.
(ii) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවිය යුතු ණය පොලියෙන් බාගයක් පමණක් ගෙවා ඇත.
(iii) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 100 000 ක් වැයකර ගොඩනැගිල්ලට නව කොටසක් එකතු කරන ලදී. තවද වර්ෂය තුළ දී සමාගම සතු ඉඩම් කැබැල්ලක් රු. 600 000 ක මුදලකට විකුණන ලදී.
(iv) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී යන්ත්‍ර සූත්‍ර කිසිවක් මිල දී ගෙන හෝ විකුණා හෝ නොමැත.
(v) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී කොටස් නිකුත් කිරීමක් හෝ ලාභාංශ ගෙවීමක් හෝ සිදුකර නොමැත.

**අවශ්‍යවන්නේ:**

අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

*(ලකුණු 10 යි)*

*(මුළු ලකුණු 15 යි)*

www.pastpaperlk.com www.artsapi.lk

6. (අ) මහනුවර පාසලක වානිජ සංගමය විසින් යාපනයට යැමට තෙදින අධ්‍යාපන චාරිකාවක් සංවිධානය කෙරේ. සංගමයේ බැංකු ගිණුමේ රු. 20 000 ක ශේෂයක් ඇති අතර මෙම මුදල චාරිකාවට යොද ගැනෙන බස්රථ කුලී ගෙවීම සඳහා යෙදවීමට සාමාජිකයෝ එකඟ වූහ.

පහත ඇස්තමේන්තු ද ලැබී ඇත.

| | |
|---|---|
| බස් රථ සඳහා කුලිය | - එක් රථයකට රු. 45 000 බැගින් (බස් රථයකට සිසුන් 50 බැගින්) |
| සංචාරක නිවාස සඳහා දින 3 ට කුලී | - සංචාරක නිවාසයකට රු. 20 000 බැගින් (සංචාරක නිවාසයකට සිසුන් 25 බැගින්) |
| ආහාර සඳහා වියදම් | - සිසුවකුට දිනකට රු. 600 බැගින් |
| වතුර බෝතල් සඳහා වියදම් | - සිසුවකුට දිනකට රු. 200 බැගින් |
| අනෙකුත් වියදම් | - සිසුවකුට රු. 600 බැගින් |

සිසුන් 100 දෙනකු චාරිකාවට සහභාගි වන බව උපකල්පනය කරන්න.

**අවශ්‍යවන්නේ:**

(1) සිසුන් 100 දෙනකුගෙන් සමච්ඡේද මට්ටමට ළඟාවීමට නම්, එක සිසුවකුගෙන් අයකළ යුතු මුදල කොපමණ ද?

(2) අතිරික්තයක් තිබේනම්, එම මුදල්, සංචාරය තුළ දී ආගමික ස්ථානවලට පරිත්‍යාග කිරීමට සංගමය බලාපොරොත්තු වේ. එක සිසුවකුගෙන් රු. 5 000 ක් අයකරනු ලැබුවේ නම්, පරිත්‍යාග කළ හැකි මුදල කොපමණ ද?

*(ලකුණු 05 යි)*

(ආ) තරුණයන්ගේ ඉංග්‍රීසි භාෂා හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් පවත්වාගෙන යන ලාභ නොලබන ආයතනයක් වන උදර සුහසාධක සංගමයේ වාර්තාවලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

(i) 2012.03.31 දිනට සංගමයේ සාමාජිකයින් ගණන 50 ක් වූ අතර එක් අයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 2 000 කි.

(ii) සංගමයේ වත්කම් සහ වගකීම් :

| | 2012.03.31 දිනට (රු.'000) | 2011.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| හිඟ හිටි සාමාජික මුදල් | 6 | 10 |
| කලින් ලද සාමාජික මුදල් | 12 | 8 |
| තොගය - ඉංග්‍රීසි භාෂා පොත් | 60 | 50 |
| ලී බඩු සහ සවිකිරීම් (ධාරණ වටිනාකම) | 160 | 180 |
| බැංකුවේ ඇති මුදල් | ? | 10 |

(iii) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දරන ලද සහ මුදලින් ගෙවූ වියදම්:

| | රු.'000 |
|---|---|
| ඉංග්‍රීසි භාෂා පොත් ගැනුම් | 100 |
| කාර්යාල කුලිය | 60 |
| ගිණුම් ලිපිකරුගේ වැටුප | 60 |
| කාර්යාල වියදම් | 30 |

(iv) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංගමයට රු. 200 000 ක පරිත්‍යාග ලැබී ඇත. පරිත්‍යාග, ඒවා ලැබූ වර්ෂයේ දී ම ආදයම් ලෙස හඳුනාගැනීම සංගමයේ ප්‍රතිපත්තියයි.

**අවශ්‍යවන්නේ:**

(1) 2011.04.01 දිනට සමුච්චිත අරමුදල

(2) 2012.03.31 දිනට බැංකුවේ ඇති මුදල

(3) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදයම් සහ වියදම් ගිණුම

*(ලකුණු 10 යි)*

*(මුළු ලකුණු 15 යි)*

www.pastpaperlk.com
www.artsapi.lk

**7. (අ)** සමාගමක් විසින් ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු සඳහා A යන්ත්‍රය හෝ B යන්ත්‍රය මිල දී ගැනීමට සලකා බලමින් සිටී. එක් එක් යන්ත්‍රය රු. 400 000 බැගින් මිලට ගත හැකිය. පහත තොරතුරු ද දී ඇත.

(i) අපේක්ෂිත ශුද්ධ මුදල් ප්‍රවාහ ගලාඒම්

| වසර | A යන්ත්‍රය (රු.'000) | B යන්ත්‍රය (රු.'000) |
|---|---|---|
| 1 | 100 | 75 |
| 2 | 150 | 100 |
| 3 | 180 | 205 |
| 4 | 150 | 240 |

(ii) වසර හතර සඳහා අපේක්ෂිත ශුද්ධ මුදල් ප්‍රවාහ ගලාඒම්වල වර්තමාන අගයවල එකතුව (10% වට්ටම් සාධකය මත)

| | (රු.'000) |
|---|---|
| A යන්ත්‍රය | 452 |
| B යන්ත්‍රය | 468 |

**අවශ්‍යවන්නේ:**

(1) එක් එක් යන්ත්‍රයේ පිළිගෙවුම් කාලය ගණනය කර එම ක්‍රමය මත මිල දී ගැනීමට වඩාත් සුදුසු කුමන යන්ත්‍රය ද යන්න හේතුව සහිතව දක්වන්න.

(2) එක් එක් යන්ත්‍රයේ ශුද්ධ වර්තමාන අගය ගණනය කර එම ක්‍රමය මත මිල දී ගැනීමට වඩාත් සුදුසු කුමන යන්ත්‍රය ද යන්න හේතුව සහිතව දක්වන්න.

(3) ඉහත (1) සහ (2) ට ලැබෙන පිළිතුරු එකිනෙකට වෙනස් නම් සමාගම විසින් තෝරාගත යුත්තේ කුමන යන්ත්‍රය ද යන්න හේතුව සහිතව දක්වන්න. *(ලකුණු 05 යි)*

**(ආ)** 2012.03.01 දිනට සීමිත අකලංක සමාගමේ ණයගැති ලෙජරයේ ශේෂවල එකතුව පහත පරිදි වේ.

| ණයගැතියා | 2012.03.01 දිනට ශේෂය (රු.'000) |
|---|---|
| අශෝක | 100 |
| සුනිමල් | 150 |
| සමනල | 50 |
| **එකතුව** | **300** |

සමාගමේ මූලික පොත්වලින් උපුටාගත් 2012 මාර්තු මාසයේ සිදු වූ ණයට විකුණුම් සහ ආශ්‍රිත ගනුදෙනුවල විස්තර පහත පරිදි වේ. (සියලු ම වටිනාකම් රු.'000 වලින් දී ඇත.)

| ණයගැතියා | විකුණුම් | ආපසු එවුම් | මුදල් ලැබීම් | දුන් වට්ටම් | බොල්ණය කපා හැරීම් |
|---|---|---|---|---|---|
| අසෝක | 125 | 25 | 100 | - | - |
| කුමාර | 120 | 20 | - | - | - |
| සුනිමල් | 90 | - | 50 | - | - |
| කමල් | 265 | - | 135 | 20 | - |
| සමනල | - | - | - | - | 50 |
| **එකතුව** | **600** | **45** | **285** | **20** | **50** |

2012.03.01 දිනට ණයගැති ලෙජර් ශේෂවල එකතුව ණයගැති පාලන ගිණුමේ ශේෂයට එකඟ විය. නමුත් 2012.03.31 දිනට මෙම ශේෂ දෙක එකඟ නොවීය. පසුව කරන ලද විමර්ශනවලින් ණයගැති පාලන ගිණුම නිවැරදි ව පිළියෙල කර ඇති බව අනාවරණය වූ නමුත් ගනුදෙනු ණයගැති ලෙජරයේ සටහන් කිරීමේ දී පහත වැරදි සිදුවී ඇත.

(i) අසෝක විසින් නැවත එවන ලද භාණ්ඩ සටහන් වී නොමැත.

(ii) සුනිමල්ට කරන ලද විකුණුම් සටහන් වී ඇත්තේ විකුණන ලද භාණ්ඩවල ලැයිස්තුගත මිලට ය. (මෙම භාණ්ඩවල ලැයිස්තුගත මිල රු. 100 000 කි.)

(iii) සමනලගේ ආරම්භක ශේෂය බොල්ණය ලෙස කපා හැරීම සටහන් වී නොමැත.

මාසය අවසානයේ ණයගැති ශේෂය මත 10% ක අඩමාන ණය සඳහා වෙන් කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. කපාහරින ලද බොල්ණය සටහන් කරනුයේ ද අඩමාන ණය සඳහා වෙන් කිරීමේ ගිණුම තුළිනි.

**අවශ්‍යවන්නේ:**

(1) 2012 මාර්තු මාසය සඳහා ණයගැති පාලන ගිණුම සහ අඩමාන ණය සඳහා වෙන් කිරීමේ ගිණුම

(2) ඉහත දී ඇති වැරදි නිවැරදි කිරීමට පෙර 2012.03.31 දිනට ණයගැති ලෙජර ශේෂවල එකතුව

*(ලකුණු 10 යි)*

*(මුළු ලකුණු 15 යි)*

* * *

www.pastpaperlk.com www.artsapi.lk